චක්‍රලේඛ අංක: 35 /2013

මගේ අංක :ඩබ්/03/2013
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09
2013-10-10

සියලුම බන්ධනාගාර අධිකාරී සහ සහකාර අධිකාරීන් වෙත.

**වැඩසහන ක්‍රමය මත දීර්ඝ කාලීන සිරකරුවන් සේවයේ යෙදවීම හා කෙටිකාලීන සිරකරුවන් පිටත සේවයේ යෙදවීම**

ඉහත කරුණට අදාළව මගේ අංක :ඩබ්/03/2010 හා 2010-02-08 දිනට නිකුත් කරන ලද අංක 12/ 2010 චක්‍රලේඛය පහත සඳහන් පරිදි සංශෝධනය කරන අතර එම නියමයන් 2013-10-15 දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට දන්වමි.

වැඩසහන ක්‍රමය යටතේ සිරකරුවන් සැපයීමේදී හා කෙටිකාලීන සිරකරුවන් පිටත සේවයේ යෙදවීමේදී එක් එක් සිරකරුවකු සඳහා සේවා යොජකයින් විසින් දැනට ගෙවනු ලබන රු. 300.00 දෛනික වැටුප 2013-10-15 දින සිට රු.500.00 දක්වා වැඩි කිරීමට නියෝග කරමි. එබැවින් පහත සඳහන් උපදෙස් පරිදි ක්‍රියා කිරීමට වග බලා ගන්නා ලෙස දන්වමි.

1. ඉහත කී ක්‍රමය යටතේ සිරකරුවන්ගේ ශ්‍රමය සැපයෙන සියලු ආයතන අමතා 2013-10-15 දින සිට ඉහත සඳහන් කල පරිදි වැඩිකල වැටුප් ගෙවන ලෙසත් දිවා ආහාරය හා තේ පැන් සඳහා එම රු.500.00 ක දෛනික වැටුපෙන් රු:100.00 ක් අඩුකර වඩාත් ප්‍රමිතියකින් යුතු ආහාර හා තේ පැන් සපයන ලෙසත් අදාල සේවායෝජකයින්ට දන්වන්න.

2. ඉහත සඳහන් පරිදි වැඩිකරඇති සිර දෛනික වැටුප පහත සඳහන් පරිදි බෙදා වෙන් කිරීමට කටයුතු කර සිරකරුට හිමි ගෙවීම නියමිත පරිදි ඔහුට ලබාදීමට කටයුතු කල යුතුය.

2.1 වැඩසහන ක්‍රමය මත යොදන සිරකරුවන් සඳහා වැටුප් ගෙවීම

| | | |
|---|---|---|
| දෛනික වැටුප | | රු.500.00 |
| දිවා ආහාරය හා තේ සඳහා අඩු කිරීම | | රු.100.00 |
| ඉතිරිය | | රු.400.00 |
| රජයේ ගිණුමට අඩු කිරීම | 10 % | රු. 40.00 |
| සිරකරු සුභසාධක අරමුදලට අඩුකිරීම | 10 % | රු. 40.00 |
| නිළධාරී ත්‍යාග අරමුදලට අඩුකිරීම | 10 % | රු. 40.00 |
| ඒ අනුව සිරකරුට ගෙවිය යුතු මුදල | 70 % | රු.280.00 |

දැනට විශ්‍රාමික නිළධාරියෙකුට ගෙවනු ලබන රු.400.00 දෛනික දීමනාව හා සෙසු උපදෙස් එපරිදිම ක්‍රියාත්මක කල යුතුය.

2.2 කෙටිකාලීන සිරකරුවන් පිටත සේවයේ යෙදවීම සඳහා වැටුප් ගෙවීම

| | | |
|---|---|---|
| දෛනික වැටුප | | රු.500.00 |
| දිවා ආහාරය හා තේ සඳහා අඩු කිරීම | | රු.100.00 |
| ඉතිරිය | | රු.400.00 |
| රජයේ ගිණුමට අඩු කිරීම | 10 % | රු. 40.00 |
| සිරකරු සුභසාධක අරමුදලට අඩුකිරීම | 10 % | රු. 40.00 |
| නිළධාරී ත්‍යාග අරමුදලට අඩුකිරීම | 10 % | රු. 40.00 |
| ඒ අනුව සිරකරුට ගෙවිය යුතු මුදල | 70 % | රු. 280.00 |

දැනට මේ සඳහා ආරක්ෂණය කරන නිළධාරියෙකුට ගෙවනු ලබන රු.400.00 දෛනික දීමනාව හා සෙසු උපදෙස් එපරිදිම ක්‍රියාත්මක කල යුතුය.

මෙ වැඩපිළිවෙල යටතේ සිරකරුවන් ප්‍රවාහනය කිරීම සඳහා සේවා ආයතනයන් විසින් ප්‍රවාහන පහසුකම් සැපයිය යුතු බවද මෙයින් දන්වමි.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**චන්ද්‍රරත්න පල්ලේගම**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය,**
**කොළඹ 09.**